**ශීර්ෂය 102 - මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

ශීර්ෂය 102 - මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2023 මැයි 26 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 ජුනි 28 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

#### 2.1.1 ප්‍රතිපාදන උපයෝජනය

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වැය විෂයයන් 35 ක් සම්බන්ධයෙන් 2022 වර්ෂයේදී වෙන් කරන ලද රු.18,475,000 ක් වූ මුළු ශුද්ධ ප්‍රතිපාදනයම උපයෝජනයෙන් තොරව ඉතිරි වී තිබුණි. | මූලධන වියදම් සීමා කිරීම, ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශය, සංවර්ධන සම්බන්ධීකරණ හා අධීක්ෂණ අමාත්‍යාංශය හා ආයෝජන ප්‍රවර්ධන මණ්ඩලය ඇවර කර මෙම අමාත්‍යාංශයට ප්‍රතිපාදන පැවරීම හා අපේක්ෂිත පරිදි වවුචර් ඉදිරිපත් නොවීම. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව නිවැරදි ඇස්තමේන්තු පිළියෙල කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (ආ) | සැලසුම් කරන ලද කාර්යයන් ඉටු කිරීමට වැය විෂයයන් 36 ක් සඳහා 2022 වර්ෂයේදී වෙන් කරන ලද රු.274,472,366 ක් වූ ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු195,555,743 ක් උපයෝජනය කිරීමෙන් තොරව ඉතිරි වී පැවතුණි. ඉතිරි කිරීම් එම වැය විෂයයන්ගේ මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 51 සිට සියයට 99 ක පරාසයක් ගෙන තිබුණි. සමාලෝචිත වර්ෂයේ රාජ්‍ය වියදම් පාලනය කිරීම සහ සීමා කිරීම සම්බන්ධයෙන් චක්‍රලේඛ විධිවිධාන පනවා තිබුණ ද, මෙම වැය විෂයයන්ගේ ඉතිරියේ ප්‍රමාණය සැලකිය යුතු ප්‍රමාණයක් බව නිරීක්ෂණය විය. | අපේක්ෂිත පරිදි වියදම් අවශ්‍යතා පැන නොනැඟීම, අමාත්‍යාංශ 02 ක් ඇවර කර මෙම අමාත්‍යාංශයට ප්‍රතිපාදන පැවරීම, ප්‍රමාණවත් පරිදි අක් මුදල් ලබා නොදීම හා අපේක්ෂිත පරිදි වවුචර්පත් ඉදිරිපත් නොවීම. | ප්‍රතිපාදන උපරිම අයුරින් කාර්යක්ෂම ලෙස උපයෝජනය කිරීමට කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | වැය විෂයයන් 03 ක් සඳහා මූලික ඇස්තමේන්තු ප්‍රතිපාදන සලසා නොගෙන පරිපූරක ඇස්තමේන්තු ප්‍රතිපාදන යටතේ රු.102,200,000 ක ප්‍රතිපාදන සලසාගෙන එයින් එකතුව රු.90,258,499 ක් පමණක් වැය කර එකතුව රු.11,941,501 ක මුදලක් ඉතිරි කර තිබුණි. | රජය සතු ව්‍යාපාර ප්‍රතිව්‍යුහගත කිරීමේ ඒකකය ආරම්භ කිරීමේ කටයුතු ප්‍රමාද වීම. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී නිවැරදිව හා තාත්ත්විකව පිළියෙල කළ යුතු වීම. |

**2.1.2 අමාත්‍යාංශයේ ඒකක හා වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබාදී ඇති ප්‍රතිපාදන**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රාජ්‍ය ආයතන හා අමාත්‍යාංශයේ ඒකක 08 ක් වෙත වියදම් දැරීම සඳහා 2022 වර්ෂයේදී සලසන ලද එකතුව රු.440,300,000 ක් වූ ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.352,362,212 ක් හෙවත් සියයට 41 – 100 දක්වා පරාසයක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. එම ඉතිරිවීම්වලට හේතු ලෙස නිලධාරීන් පත් කිරීම ප්‍රමාද වීම, ගිවිසුම් සංශෝධනය, වවුචර් ඉදිරිපත් නොවීම, අක් මුදල් ලබා නොදීම හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම ප්‍රමාද වීම් ලෙස දක්වා තිබීම නිසා එම අංශවල හා ආයතනවල සැලසුම් කරන ලද කාර්යයන් ඉටු කිරීමට නොහැකි වී තිබුණි. | ප්‍රතිව්‍යුහගත කිරීමේ ඒකකය ආරම්භ කිරීමේ කටයුතු ප්‍රමාදවීම, සේවා සපයන ආයතන සමඟ ඇතිකර ගත් ගිවිසුම් සංශෝධනය, අපේක්ෂිත පරිදි වවුචර් ඉදිරිපත් නොවීම, ප්‍රමාණවත් පරිදි අක්මුදල් ලබා නොදීම, ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම ප්‍රමාද වීම, කාර්ය මණ්ඩලය බඳවා ගැනීමට නොහැකි වීම, ඉන්ධන අර්බුදය හේතුවෙන් පුහුණු වැඩසටහන් පැවැත්වීමට නොහැකි වීම හා අනුමත කාර්ය මණ්ඩලය බඳවා නොගැනීම හේතුවෙන් සැලසුම් කරන ලද කාර්යයන් ඉටු කිරීමට නොහැකි විය. | රාජ්‍ය ආයතන හා ඒකකවල අරමුණු ඉටු කර ගැනීම සඳහා සලසා තිබුණු ප්‍රතිපාදන, කාර්යක්ෂම ලෙස උපයෝජනය කළ යුතු වීම. |

**2.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගෙවීම හා පියවීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සේවය අතහැර ගොස් ඇති නිලධාරීන් 04 දෙනෙකුගෙන් වසර 05 සිට වසර 18 දක්වා කාලයක් ඉක්මවූ අයවිය යුතු ණය ශේෂ එකතුව රු.480,861 ක් සහ මාස 3-12 අතර කාල පරාසය තුළ අයවිය යුතු රු.119,073 ක ණය ශේෂය වශයෙන් එකතුව රු.599,934 ක ණය ශේෂයක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අමාත්‍යාංශය වෙත අයවී නොතිබුණි. | නිලධාරීන් දෙදෙනෙකුගේ ණය පිළිබඳ කටයුතු කිරීමට නීතිපති දෙපාර්තමේන්තුව වෙත ලිපි යොමු කර ඇත. නිලධාරීන් දෙදෙනෙකුගේ ණය මුදල්වල ඇපකරුවන් හට ණය මුදල් පියවන ලෙස දන්වා ඇත. එක් නිලධාරියෙකුගේ ණය ශේෂය පියවන ලෙස දන්වා යවා ඇත. | හිඟ ණය ශේෂ අයකර ගැනීමට කඩිනම් පියවර ගත යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අංශයට අනුයුක්තව සිටි නිලධාරීන්ගෙන් අයවිය යුතු ණය ශේෂ එකතුව රු. 3,522,356 ක් විය. සමාලෝචිත වර්ෂය අවසන් වන විට එම හිඟ ණය ශේෂ අමාත්‍යාංශය වෙත අයවී නොතිබුණු අතර, 2023 අප්‍රේල් 21 දින වන විට රු. 67,718 ක මුදලක් පමණක් අයවී තිබුණි. | 2023 වර්ෂයේදී නිලධාරීන් දෙදෙනෙකුගේ ණය වාරික වශයෙන් අයකර අමාත්‍යාංශය වෙත එවනු ලැබේ. එක් නිලධාරියෙකුගේ ණය ශේෂය පියවා ඇත. එක් නිලධාරියෙකුගේ ණය ශේෂය පොත්වලින් කපා හැරීමට කටයුතු කරමින් පවතී. | හිඟ ණය ශේෂ අයකර ගැනීමට කඩිනම් පියවර ගත යුතු වීම. |
| (ඇ) | සේවය අතහැර ගිය නිලධාරියෙකුගෙන් අයවිය යුතු වර්ෂ 1-2 කාලපරාසය ඉක්මවූ හිඟ ණය ශේෂය රු.170,562 ක් විය. මෙම ණය ශේෂය සමාලෝචිත වර්ෂය අවසන් වන විට අමාත්‍යාංශය වෙත අයවී නොතිබුණි. මෙම අයකර ගත යුතු ණය ශේෂයෙන් 2023 අප්‍රේල් 21 දින වන විට රු. 5,000 ක මුදලක් පමණක් අයවී තිබුණි. | 2023 වර්ෂයේදී වාරික වශයෙන් අයකර ගනිමින් පවතී. | හිඟ ණය ශේෂ අයකර ගැනීමට කඩිනම් පියවර ගත යුතු වීම. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

#### 3.1.1 ප්‍රගතිය ඉදිරිපත් කර නොතිබීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ 2022 වර්ෂයට අදාළ ක්‍රියාකාරී සැලැස්ම අනුව දක්වා තිබුණු භාණ්ඩාගාර විශේෂ කාර්යයන්ට අදාළ ක්‍රියාකාරකම්වල ප්‍රගතිය සමාලෝචිත වර්ෂයට අදාළ කාර්යසාධන වාර්තාවේ දක්වා නොතිබුණි. | අමාත්‍යාංශයේ අරමුණු ඉටු කර ගැනීම සඳහා සියලුම භාණ්ඩාගාර දෙපාර්තමේන්තු මෙහෙයවීම සිදු කළ අතර, එමඟින් ප්‍රායෝගිකව පැවති තත්ත්වයන් කළමනාකරණය කර ගැනීම සඳහා මූල්‍ය මෙහෙයුම් කටයුතු සිදු කරන ලදි. | සමාලෝචිත වර්ෂයට අදාළව ඉටු කරන ලද ක්‍රියාකාරකම් හා ඒ සම්බන්ධව ප්‍රගතිය කාර්යසාධන වාර්තාවට ඇතුළත් කළ යුතු වීම. |
| (ආ) | අමාත්‍යාංශයේ ආයතන අංශය විසින් මුදල් අමාත්‍යාංශය යටතේ ඇති, රාජ්‍ය ව්‍යවසායන් සහ අරමුදල් අධීක්ෂණය, මගපෙන්වීම, පරිපාලනය හා ප්‍රශස්ත කාර්යසාධනය සහතික කිරීම, මුදල් අමාත්‍යාංශය යටතේ ඇති රාජ්‍ය ව්‍යවසායන්හි අරමුදල් සහ දෙපාර්තමේන්තු සම්බන්ධ ප්‍රසම්පාදන ක්‍රියාකාරකම් සිදු කිරීම, මුදල් අමාත්‍යාංශය සහ එහි දෙපාර්තමේන්තු | රාජ්‍ය ව්‍යවසායන්ගේ කටයුතු අධීක්ෂණයට හා ප්‍රතිව්‍යුහගතකරණයට විශේෂ පියවර ගැනීමට ප්‍රතිපත්තිමය තීරණයක් ගන්නා ලද අතර, එම කටයුතු මේ වන විට ද ආරම්භ වී ඇත. ITMIS හා E-GP ව්‍යාපෘතීන්වල තවදුරටත් අවශ්‍ය වැඩිදියුණු කිරීමට පහසුකම් සලසා ඇත. වෙළඳ හා ආයෝජන සඳහා පහසුකම් සැලසීමට අදාළ දෙපාර්තමේන්තු මඟින් කාර්ය | සමාලෝචිත වර්ෂයට අදාළව ඉටු කරන ලද ක්‍රියාකාරකම් හා ඒ සම්බන්ධව ප්‍රගතිය කාර්යසාධන වාර්තාවට ඇතුළත් කළ යුතු වීම. |

| | | |
|---|---|---|
| මගින් සිදු කරනු ලබන ව්‍යාපෘති අධීක්ෂණය කිරීම යන කාර්යයන්වලට අදාළ ක්‍රියාකාරකම් සිදු කිරීමට අපේක්ෂා කර තිබුණ ද, එහි ප්‍රගතිය පිළිබඳ තොරතුරු සමාලෝචිත වර්ෂයට අදාළ කාර්යසාධන වාර්තාවේ දක්වා නොතිබුණි | පරිපාටි සරල කිරීම සඳහා විශේෂ පහසුකම් සැලසීම හා නිලධාරීන්ගේ අත්‍යාවශ්‍ය පුහුණුවීම් හා මානව සම්පත් කළමනාකරණය නිසි පරිදි පවත්වා ගැනීම උදෙසා අවශ්‍ය අවධානය යොමු කරන ලදි. | |

### 3.1.2 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මුදල් අමාත්‍යාංශය යටතේ දේශීය අරමුදල්/ විදේශ ණය/ ආධාර යොදවා ක්‍රියාත්මක කරන සමාජ ආරක්ෂණ ජාල ව්‍යාපෘතිය (SSNP) සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 262 ක් ද, මූල්‍ය අංශ නවීකරණ ව්‍යාපෘතිය (FSMP) සඳහා එකතුව රු.මිලියන 204.15 ක් ද වශයෙන් ප්‍රතිපාදන සලසා තිබුණි. එම ව්‍යාපෘතිවල කාර්යසාධනය මන්දගාමී ස්වරූපයක් ගැනීම හේතුවෙන් සමාජ ආරක්ෂණ ජාල ව්‍යාපෘතිය (SSNP) සඳහා සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 79 ක් හෙවත් රු.මිලියන 207.61 ක් හා මූල්‍ය අංශ නවීකරණ ව්‍යාපෘතිය (FSMP) සඳහා සලසා තිබුණු ප්‍රතිපාදනවලින් රු.මිලියන 192.29 ක් ලෙස එම ව්‍යාපෘති වෙනුවෙන් උපයෝජනය නොකර ඉතිරි වී තිබුණි. | 2022 වර්ෂයේ පෙබරවාරි මාසයේදී ලෝක බැංකුව විසින් ලබා දුන් උපදෙස් අනුව, ව්‍යාපෘතිය අවසන් වන දිනය වන විට නිම කිරීමට නොහැකි වන ඇතැම් ප්‍රසම්පාදන කටයුතු ක්‍රියාත්මක නොකිරීම නිසා වෙන්කරන ලද ප්‍රතිපාදන ඉතිරි වී ඇත. | ව්‍යාපෘති අරමුණු ඉටු කර ගැනීම සඳහා සලසා තිබුණු ප්‍රතිපාදන, කාර්යක්ෂම ලෙස උපයෝජනය කළ යුතු වීම. |
| (ආ) | මූල්‍ය අංශ නවීකරණ ව්‍යාපෘතිය යටතේ Insurance Regulatory Commission of Sri Lanka (IRCL) සඳහා සමාලෝචිත වර්ෂයේ වෙන් කළ ප්‍රතිපාදනය වූ රු.143,150,000 කින් රු.105,000,000 ක්, හෙවත් ඇස්තමේන්තු ප්‍රතිපාදනයෙන් සියයට 73 ක් අදාළ කාර්යයට යොදවා නොගෙන මූල්‍ය අංශ නවීකරණ ව්‍යාපෘතියේ වෙනත් ආයතනයක් වන Securities and Exchange Commission (SEC) වෙත මාරු කර තිබුණි. | ඇස්තමේන්තුගත කළද අදාළ වැය ශීර්ෂය (102-2-3-3-2509-31/12) සඳහා අපේක්ෂිත වියදම් පැන නොනැගීම හේතුවෙන් එම ව්‍යාපෘතියේම වෙනත් අත්‍යාවශ්‍ය වැය ශීර්ෂයක් වෙත මු.රෙ. 66 අනුව ප්‍රතිපාදන මාරු කරගන්නා ලදී. | ව්‍යාපෘති අරමුණු ඉටු කර ගැනීම සඳහා සලසා තිබුණු ප්‍රතිපාදන, කාර්යක්ෂම ලෙස උපයෝජනය කළ යුතු වීම. |

## 3.2 ප්‍රසම්පාදනයන්

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | මහා භාණ්ඩාගාර ගොඩනැගිල්ලෙහි ස්ථාපිත භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ සිදු කළ අලුත්වැඩියාවක් සඳහා රු.15,698,375 ක ඉංජිනේරු ඇස්තමේන්තුවක් සකස් කර තිබුණු අතර, විවෘත මිල ගණන් කැඳවා රු 12,732,080.ක පිරිවැයකට (බදු රහිත) කොන්ත්‍රාත්තුව පිරිනමා 2022 මැයි 05 දින වන විට කොන්ත්‍රාත්කරුට රු.8,418,434 ක් ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කෙරේ. | | |
| (අ) | ලංසු වටිනාකම ඉංජිනේරු ඇස්තමේන්තුවට වඩා සියයට 20 ක අඩුවක් පැවති බැවින්, 2021 ජනවාරි 11 දිනැති අංක 3/2020(i) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය හා ICTAD ආයතනය නිකුත් කර ඇති උපදෙස් මාලාවේ ITB 34:2 වගන්තිය ප්‍රකාර කාර්යසාධන සුරක්ෂණ සියයට 15 ක් විය යුතු විය. අමාත්‍යාංශය විසින් 2021 දෙසැම්බර් 31 දින දක්වා සියයට 15 කාර්යසාධන සුරක්ෂණ ලබා ගෙන තිබුණ ද, 2022 ජනවාරි 01 සිට 2022 අගෝස්තු 12 දක්වා සියයට 5 ක් පමණක් වන පරිදි කාර්යසාධන සුරක්ෂණයක් ලබාගෙන තිබුණු බව නිරීක්ෂණය විය. | බැඳුම්කර කාලය තවදුරටත් දීර්ඝ කිරීමට කටයුතු කර නොමැති බව කාරුණිකව දන්වමි. | රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව හා **ICTAD** විසින් නිකුත් කර ඇති උපදෙස් අනුව කාර්යසාධන සුරක්ෂණ ලබාගත යුතු වීම |
| (ආ) | අදාළ කොන්ත්‍රාත්තුව 2021 ජූලි 16 දින නිම කර භාරදිය යුතු වුවත් කොන්ත්‍රාත්කරු විසින් 2021 දෙසැම්බර් 10 දක්වා දින දීර්ඝ කිරීම් ඉල්ලා තිබුණ ද, දින දීර්ඝ කිරීම සඳහා කොන්ත්‍රාත්කරු ඉදිරිපත් කර ඇති හේතු පිළිගත හැකි මට්ටමේ නොමැති බව උපදේශන ආයතනය දන්වා තිබියදීත් කොන්ත්‍රාත් කාලය 2021 දෙසැම්බර් 10 දක්වා දීර්ඝ කර තිබුණු බව නිරීක්ෂණය විය. | උපදේශන ආයතනයේ ලබා දී ඇති එකගත්වය මත දින දීර්ඝ කිරීම් අනුමත කර ඇත. | පිළිගත හැකි හේතු මත පමණක් කොන්ත්‍රාත් කාලය දීර්ඝ කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (ඇ) | විගණනයට ඉදිරිපත් වූ තොරතුරු අනුව කොන්ත්‍රාත් කාලය 2021 දෙසැම්බර් 10 දිනෙන් පසුව දීර්ඝ කර නොතිබුණු අතර, 2022 පෙබරවාරි 28 දක්වාත් ඉදිකිරීම් සිදු කර තිබුණි. ඒ අනුව, කොන්ත්‍රාත් ගිවිසුමේ 49.1 වගන්තිය ප්‍රකාරව 2022 පෙබරවාරි 28 දක්වා ප්‍රමාද ගාස්තු ලෙස රු.1,018,566 ක් අයවිය යුතු වුවත්, අමාත්‍යාංශය ඒ අනුව අය කිරීමට කටයුතු කර නොතිබුණු බව නිරීක්ෂණය විය. | ප්‍රමාද ගාස්තු අය නොකරන ලදි. | කොන්ත්‍රාත් ගිවිසුම ප්‍රකාරව ප්‍රමාද ගාස්තු අයකිරීමට කටයුතු කළ යුතු වීම. |

### 3.3 වත්කම් කළමනාකරණය

#### 3.3.1 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| අමාත්‍යාංශයේ 2022 භාණ්ඩ සමීක්ෂණ වාර්තා අනුව අමාත්‍යාංශයට අයත් අංශ 06 ක පිරිවැය රු.2,111,801 ක් වටිනා භාණ්ඩ අතිරික්තතා හඳුනාගෙන තිබුණ ද, ඒවා විධිමත් පරිදි ඉන්වෙන්ට්‍රිගත කිරීමට කටයුතු කර නොතිබුණි. | නිවැරදි කිරිම සඳහා අදාළ අංශ වෙත උපදෙස් ලබා දී ඇත. | අතිරික්ත භාණ්ඩ ඉන්වෙන්ට්‍රිගත කිරීමට කටයුතු කළ යුතු වීම. |

#### 3.3.2 වාහන

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) අමාත්‍යාංශයේ ප්‍රවාහන අංශය පවත්වාගෙන ගිය වාහන ලේඛනයට අනුව අමාත්‍යාංශය සතු වාහන 29ක්, වෙනත් ආයතන වෙත නිදහස් කර තිබුණත්, ඒවා විධිමත් පරිදි පවරා දී නොතිබුණි. | අදාළ වාහන විධිමත් පරිදි ලබා දුන්නේ නම් අමාත්‍යාංශය සතු වාහන ප්‍රමාණය අඩු වන අතර, එම වාහන අමාත්‍යාංශයේ අවශ්‍යතාවය මත නැවත ලබා ගැනීමට නොහැකි වන බව දන්වා සිටිමි. | විධිමත් පරිදි පවරා දීමට හෝ නැවත අමාත්‍යාංශය වෙත ලබා ගැනීමට හෝ කටයුතු කළ යුතු වීම. |
| (ආ) දෙසැම්බර් 31 වන විට අමාත්‍යාංශයේ CIGAS පරිගණක මෘදුකාංග පද්ධතියේ SA 82 පරිගණක මුද්‍රිතයේ සඳහන් වත්කම් ලැයිස්තුව (Asset List) අනුව වාහන අංක හා ඊට අදාළ පිරිවැයන් වෙන් වෙන් වශයෙන් හඳුනාගත නොහැකි වූ බැවින්, අමාත්‍යාංශය සතු මුළු වාහන සංඛ්‍යාව පරිගණක මුද්‍රිත මඟින් නිශ්චය කර ගත නොහැකි විය. තවද, අමාත්‍යාංශයේ 2022 දෙසැම්බර් 31 දිනට පවත්වාගෙන ගිය ස්ථාවර වත්කම් ලේඛනය අනුව වාහන පිරිවැය රු.692,869,000 ක් වූ අතර, CIGAS පරිගණක මුද්‍රිතය (SA-82) ප්‍රකාරව එය රු.1,832,801,692 ක් වූයෙන් රු.1,131,932,692 ක වෙනසක් නිරීක්ෂණය විය. | CIGAS පරිගණක මෘදුකාංග පද්ධතිය යාවත්කාලීන කිරීමට කටයුතු කරමින් පවතින බව දන්වමි. | පරිගණක මුද්‍රිතයේ සඳහන් වත්කම් ලැයිස්තුව අනුව වාහන අංක හා ඊට අදාළ පිරිවැයන් හඳුනාගත හැකි පරිදි ක්‍රමවේදයක් සකස් කළ යුතු වීම. |

## 3.4 කළමනාකරණ දුර්වලතා

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අංක 2187/27 හා 2020.08.09, අංක 2248/35 හා 2021.10.06 සහ අංක 2254/30 හා 2021.11.17 යන ගැසට් පත්‍ර මගින් ඇවර කිරීමට හෝ වෙනත් ආයතන සමග ඒකාබද්ධ කිරීමට නියමිත විදුලි සංදේශ දෙපාර්තමේන්තුව, වනජීවී භාරය හා ශ්‍රී ලංකා ජනමාධ්‍ය අභ්‍යාස ආයතනය මුදල් අමාත්‍යාංශ විෂය පථයට ඇතුළත් කර තිබුණි. මෙම ඇවර කළ යුතු හෝ ඒකාබද්ධ කළ යුතු ආයතන සම්බන්ධයෙන් ඉදිරි කටයුතු කිරීම සඳහා නිලධාරීන් සිව්දෙනෙකුගෙන් සමන්විත කමිටුවක් 2021 දෙසැම්බර් 27 දින පත්කර තිබුණු නමුත් අදාළ ආයතන ඇවර කිරීම සම්බන්ධයෙන් 2021 ඔක්තෝබර් ගැසට් නිවේදනය පළ කර 2022 දෙසැම්බර් 31 දින වන විට වසරක් ඉක්මවී තිබුණ ද, අදාළ ආයතන ඇවර කිරීම හෝ ඒකාබද්ධ කිරීමේ කටයුතු නිමකර, නීති ප්‍රකාරව වසා දැමීම සඳහා අදාළ ගැසට් නිවේදන නිකුත් කිරීම සිදු කර නොතිබුණි. | විදුලි සංදේශ දෙපාර්තමේන්තුව සඳහා ගැසට් නිවේදනය කෙටුම්පත් කිරීම, වනජීවී භාරයට එරෙහිව නඩු පවරා තිබේද යන්න පිළිබඳව වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශයේ ලේකම් වෙතින් විමසීම් කිරීම, ශ්‍රී ලංකා ජනමාධ්‍ය අභ්‍යාස ආයතනයේ අවසන් ගිණුම් වාර්තා සකස් කිරීම පිළිබඳ තොරතුරු ඉල්ලා ලිපි යැවීම සිදු කර ඇත. | අමාත්‍යාංශයේ විෂය පථයට ඇතුළත් කර තිබුණු, ඇවර කළ යුතු ආයතන සම්බන්ධ කටයුතු නිම කර නීති ප්‍රකාරව වසා දැමීමට කටයුතු සිදු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ශ්‍රී ලංකා ආණ්ඩුවේ ඉල්ලීම පරිදි ආසියානු සංවර්ධන බැංකුවේ (ADB) 55 වන වාර්ෂික සමුළුව සඳහා සත්කාරකත්වය ලබා දීම, ආසියානු සංවර්ධන බැංකුවේ පාලක මණ්ඩලය විසින් අනුමත කර තිබුණු බවත්, ඒ සඳහා අවශ්‍ය කටයුතු සිදු කිරීමට 2021 පෙබරවාරි මස 09 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී තිබුණි. ඊට අදාළ කාර්යයන් සංවිධානය කර ගැනීම සඳහා ආසියානු සංවර්ධන බැංකුව සමඟ අවබෝධතා ගිවිසුමකට (MOU) සහ පිරිවැය බෙදාගැනීමේ ගිවිසුමකට (CSA) එළඹීමට 2021 ජූලි 27 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී තිබුණු අතර 2021 හා 2022 වර්ෂවල ඊට අදාළ වියදම් දරා තිබුණි. එහෙත් ආසියානු සංවර්ධන බැංකුවේ වාර්ෂික රැස්වීම ඉදිරි වසරක් සඳහා කල් දමන ලෙස ඉල්ලා ආසියානු සංවර්ධන බැංකුව වෙත විධිමත් සන්නිවේදනයක් කිරීමට 2022 අප්‍රේල් 16 දින අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා දී තිබූ බැවින්, සමුළුව පැවැත්වීමට අදාළව එතෙක් දරා ඇති එකතුව වූ රු.115,264,619 ක වියදම ශ්‍රී ලංකා රජයට අනාර්ථික වී තිබූ බව නිරීක්ෂණය විය. | ගිවිසුම් ප්‍රකාරව අන්තර්ජාතික සමුළු සංවිධානය කිරීමේ ආයතනය (Professional Congress Organizer) සඳහා කරන ලද ගෙවීම හැරුණු විට අනෙකුත් සියලුම වියදම් සමුළු කටයුතු සඳහා වැයවූ වියදම් වන අතර, ඉදිරි වර්ෂයකදී සමුළුව මෙරට තුළ පැවැත්වීමට නියමිත වුවහොත් ඒ සඳහා වන සංවිධාන කටයුතුවලදී මෙම වසරේදී සිදු කරන ලද මූලික සැලසුම් උදා :- web page, Registration app, …. යනාදිය අදාළ කර ගැනීමට හැකිවන අයුරින් පවත්වාගෙන යනු ලැබේ.<br>එමෙන්ම, නිලධාරීන් ලද අත්දැකීම් අනුව සමුළු කටයුතු සංවිධානය කිරීම ප්‍රාථමික මට්ටමින් නොමැතිව ද්විතීයික මට්ටමකින් කරගෙන යාමේ හැකියාවක් පවතින බවට අදහස් කරමි. | රජයේ මුදල් වැය කිරීමේදී ආර්ථික ලෙස කටයුතු කළ යුතු වීම. |

## 4. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2022 දෙසැම්බර් 31 දින වන විට අමාත්‍යාංශයේ සමස්ථ පුරප්පාඩු සංඛ්‍යාව 61 ක් වූ අතර, ඒ තුළ ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 27 ක් ද, ද්විතියික මට්ටමේ පුරප්පාඩු 17 ක් ද විය. | මෙම අමාත්‍යාංශයේ තනතුරු අනුමැතිය තුළ අමාත්‍යාංශය යටතේ ස්ථාපිත කිරීමට නියමිත වූ ආදායම් කළමනාකරණ ඒකකය සඳහා අනුමත කරන ලද තනතුරු සංඛ්‍යාවද ඇතුළත් කර ඇත. ඒ අනුව, අමාත්‍යාංශය සඳහා අනුමතව ඇති තනතුරු සංඛ්‍යාවත් තත්‍ය සේවක සංඛ්‍යාවත් සැසඳීමේදී විශාල පුරප්පාඩු සංඛ්‍යාවක් පෙන්නුම් කරන බැවින් හා අමාත්‍යාංශයේ තනතුරු සංඛ්‍යාවට ඇතුළත් නොකර වෙනම අනුමැතියක් ලෙස තැබීමට කටයුතු කරන ලෙස කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට දන්වා ඇත. | විධිමත් පරිදි කටයුතු කර පුරප්පාඩු පිරවීම හෝ අනුමත සේවක සංඛ්‍යාව සංශෝධනය කිරීමට පියවර ගත යුතු වීම. |
| (ආ) | මුදල් අමාත්‍යාංශයෙන් වැටුප් ගෙවමින් වෙනත් ආයතනවල සේවය සඳහා නිදහස් කරන ලද නිලධාරීන් 09 දෙනෙකු සඳහා 2022 දෙසැම්බර් 31 දිනට වැටුප් හා දීමනා ලෙස එකතුව රු.2,554,077 ක් ගෙවා තිබුණි. | නිලධාරීන් අනුයුක්ත කර ඇත්තේ ජනාධිපති කාර්යාලය, අග්‍රාමාත්‍ය කාර්යාලය වැනි ආයතනවලින් එම ආයතනවල පවතින සේවා අවශ්‍යතාවය අනුව කරන ලද ඉල්ලීම පරිදි වන අතර එම නිලධාරීන් නැවත මෙම අමාත්‍යාංශය වෙත නිදහස් කරන ලෙස දන්වා ඇත. | සේවය කරන ලද ආයතනවලින් වැටුප් හා දීමනා ලබා ගැනීමට හැකිවන පරිදි විධිමත් ලෙස මුදාහැරීමට කටයුතු කළ යුතු වීම. |